**මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය**

අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සාධන පරීක්ෂණය - 2025

**3 ශ්‍රේණිය**

**බුද්ධ ධර්මය**

නම/ විභාග අංකයඃ ......................................... කාලය පැය 1 යි මිනි.30

1. වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

   i. (රජගහ නුවර , කිඹුල්වත් නුවර) අග රජු සුද්ධෝදන රජතුමාය.

   ii. (ධනංජය සිටුතුමාගේ, අනේපිඬු සිටුතුමාගේ) දියණිය විශාඛා කුමරියයි.

   iii. මිගාර සිටුවරයාගේ පුතා (පූර්ණවර්ධන, නන්ද) කුමරුය.

   iv. ලංකාවට ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවූවේ (සංඝමිත්තා තෙරණින් වහන්සේ, ප්‍රජාපතී ගෝතමී තෙරණින් වහන්සේ) ය.

   v. තිත්තිර ජාතක කතාවේ වැඩිහිටියා වූයේ (වටුවා ය, වඳුරාය)

   vi. අප  බෝධි පූජා පවත්වන්නේ (බෝධීන් වහන්සේටය, බුදු පිළිම වහන්සේටය)

   vii. ලෝවැඩ සඟරාව රචනා කලේ (වීදාගම මෛත්‍රී හිමියන් ය, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන්ය)

   viii. ඇම්. ඇල්. සිල්වා ගුරු මුහන්දිරම් මහතා රචනා කළ කවි පොතකි. (සිරිත් මල්දම, ලෝකෝපකාරය)

(ල. 16)

2. පහත කියමන් හරි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

   i. ශාක්‍යයන්ගේ මානය බිඳීමට බුදුරජාණන් වහන්සේ යමා මහ පෙළහර පෑවා.(      )

   ii. විශාඛා සිටුදියණිය අවුරුදු හතේ දී රහත් වුණා. (      )

   iii. මිගාර පවුලේ අය දන් දුන්නේ නිගණ්ඨයන්ටයි. (      )

   iv. ධර්මාශෝක රජතුමාගේ දියණිය සංඝමිත්තාය. (      )

   v. සුද්ධෝදන රජතුමාගේ අගබිසව යශෝධරා දේවියයි. (      )

   vi. දුරුතු පුර පසළොස්වක පොහෝ දා අප රටට ශ්‍රී මහා බෝධිය වැඩම කරවූවා. (      )

   vii. බුදුවීම කියන්නේ උසස් නුවණටයි. (      )

   viii. රත්නමාලී සෑ රදුන් දෙව් බඹුන්ගෙන් පූජා නොලබයි. (      )

   ix. උතුම්ම ලාභය රෝගීකමයි. (      )

   x. අප සතුටු විය යුත්තේ ලද දෙයිනි. (      )

(ල. 20)

3. වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

**(විශාඛා කුමරිය, සංඝමිත්තා තෙරණිය, කාළුදායි, මහමෙවුනා උයනේ, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ, ඇත්ත, මිහින්තලාවට, ශ්‍රමදානයට)**

i. …………………. ඇමති බුදුරජාණන් වහන්සේට කිඹුල්වත් පුරයට වඩින ලෙස ආරාධනා කළා.

ii. පූර්වාරාමය සාදවන ලද්දේ …………………. ය.

iii. ශ්‍රී මහා බෝධි ශාඛාව රෝපණය කරන ලද්දේ …………………. ය.

iv. ලංකාවේ කාන්තාවන්ට භික්ෂුණී පැවිද්ද ලැබුණේ ………………….

v. බෝසතාණන් වහන්සේට බුදුවීමට සෙවණ දුන්නේ ………………….

vi. අනුබුදු හිමියන් වැඩියේ …………………. ය.

vii. …………………. එන විට අවශ්‍ය උපකරණ රැගෙන එන්න.

viii.…………………. කීම උසස් ගුණයකි.

(ල. 16)

4. ගැළපෙන පරිදි A හා B යා කරන්න.

| | A | B |
|---|---|---|
| i. | වීදාගම මෛත්‍රීය හිමියන් | සංඝමිත්තා |
| ii. | මිහිඳු හිමියන්ගේ නැගණිය | යහළුවෝ |
| iii. | විශාඛා මහ උපාසිකාව | කෝට්ටේ යුගය |
| iv. | වටුවා, වඳුරා, ඇතා | අග්‍රදායිකා |
| v. | නිග්‍රෝධාරාමය පූජා කළේ | පුස්තකාලය |
| vi. | පොත් පෙරහැර | තෙරුවන් |
| vii. | දේවානම්පියතිස්ස රජතුමා | ශාක්‍යයන් |
| viii. | බුද්ධ, ධම්ම, සංඝ | දඹකොළ පටුන |

(ල. 8)

5. පහත ප්‍රකාශ කළේ කවුරුන්දැ'යි හිස්තැන මත ලියන්න.

i. "පුතුනි, මේ මාගේ තෙවන වැඳුමයි."

……………………………………………………

ii. "වෙන කවුද කොඩි අරන් ගියේ?"

……………………………………………………

iii. "ඔව් දුවේ, ඒ වැඩ වලට අපි වැඩිහිටි අයත් එක්ක එකතු වෙමු."

..........................................................

iv. "අපේ හාමුදුරුවනේ, මම කතා කරන්නේ ලද දෙයින් සතුටු වීම ගැන."

..........................................................

(ල. 8)

6. පහත කවි සම්පූර්ණ කරන්න.

i. බුදුගුණ අසමින් සිත සත පායේ
කුරු පණ කම් ඇර පිය ඒ පායේ
.....................................................
.....................................................

ii. සමගියි දරුවන් සැම දෙන
.....................................................
මවට මෙන්ම පියාණන්ට
.....................................................

(ල. 8)

7. පිළිතුරු ලියන්න.

i. "මිගාර මාතු ප්‍රසාදය" නමින් හඳුන්වන පන්සල කුමක්ද?

.....................................................

ii. විශාඛා සිටුදුව "මිගාර මාතා" නමින් ප්‍රසිද්ධ වූයේ ඇයි?

.....................................................

iii. බෝධි පූජාවට ගෙන යා යුතු දේවල් 2ක් ලියන්න.

............................ ............................

iv. ඖෂධ පැළැටි 2ක් ලියන්න.

............................ ............................

v. ඔසුපැන් වර්ග 2ක් ලියන්න.

............................ ............................

vi. සුද්ධෝදන රජතුමා ගැන වැකි 2ක් ලියන්න.

.....................................................
.....................................................

vii. පන්සල පිරිසිදු කිරීමේ ශ්‍රමදානයේදී ඔබට කළ හැකි දෙයක් ලියන්න.

..........................................................................

viii.හොඳ යහළුවෙකුගේ ලක්ෂණ 2ක් ලියන්න.

……………………………………………………………………

……………………………………………………………………

ix. සුභාෂිත වචන 2ක් ලියන්න.

……………………………………………

……………………………………………

x. නිවස පිරිසිදුව තබා ගැනීමට කරන දේවල් 2ක් ලියන්න.

……………………………………………

……………………………………………

(ල. 20)

8. සංඝමිත්තා තෙරණිය චිත්‍රයට නගන්න.

(ල. 4)